# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2382/08 - 2024 අප්‍රේල් මස 30 වැනි අඟහරුවාදා - 2024.04.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි වූ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, මෙහි උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, එම උපලේඛනයෙහි II තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

**ප්‍රසන්න රණතුංග** (පා.ම),  
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 මාර්තු මස 21 වැනි දින,  
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,  
12 වන මහල,  
"සෙත්සිරිපාය" අදියර - II,  
බත්තරමුල්ල.

## රුවන්වැල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය පුළුල් කිරීම

### උපලේඛනය

*I තීරුව*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1992.05.29 දිනැති සහ අංක 716/21 දරන *අති විශෙෂ ගැසට පත්‍රය* අනුව නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වන්නා වූ අංක 105 වැන්දල ග්‍රාම නිලධාරි වසම ද , අංක 105B දොරනුව ග්‍රාම නිලධාරි වසම ද, අංක 109A ගෝනාරඹ ග්‍රාම නිලධාරි වසම ද, අංක 105A රුවන්වැල්ල ග්‍රාම නිලධාරි වසම ද, අංක 109 කන්නන්තොට ග්‍රාම නිලධාරි වසම ද, අංක 104A බෝපැත්ත ග්‍රාම නිලධාරි වසමෙහි කොටසක් ද, අංක 100 ඉඹුලාන ග්‍රාම නිලධාරි වසමේ කොටසක් ද හා අංක 104 මොරාවත්ත ග්‍රාම නිලධාරි වසමේ කොටස් වලට අමතරව අංක 104A බෝපැත්ත ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටස ද, අංක 100 ඉඹුලාන ග්‍රාම නිලධාරි වසමෙහි ඉතිරි කොටස ද, අංක 104 මොරාවත්ත ග්‍රාම නිලධාරි වසමෙහි ඉතිරි කොටස ද, අංක 103A මොරලිය ග්‍රාම නිලධාරි වසම ද, අංක 104B මාහැල්ල ග්‍රාම නිලධාරි වසම ද, අංක 104C දන්නෝරුව ග්‍රාම නිලධාරි වසම ද, අංක 100A නිවුන්හැල්ල ග්‍රාම නිලධාරි වසම ද, අංක 100B සියඹලාවල ග්‍රාම නිලධාරි වසම හා අංක 100C පෙතංගොඩ ග්‍රාම නිලධාරි වසම ද ඇතුළත් වන්නා වූ මුළු මහත් ප්‍රදේශය ඇතුළත් වේ.

*II තීරුව*

*උතුරට :*

රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් අංක 100ඒ නිවුන්හැල්ල ග්‍රාම නිලධාරි වසමෙහි උතුරු හා බටහිර මායිම්, අංක 100 ඉඹුලාන ග්‍රාම නිලධාරි වසමෙහි උතුරු මායිම හා එකිනෙකට හමුවන ලක්ෂ්‍යය ආරම්භක ලක්ෂ්‍යය ලෙස ගෙන එතැන් සිට එකී අංක 100ඒ නිවුන්හැල්ල ග්‍රාම නිලධාරි වසමෙහි උතුරු මායිම ඔස්සේ ගිනිකොණ හා ඊසාන දිශානුගතව අංක 100බී සියඹලාවල ග්‍රාම නිලධාරි වසමෙහි උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය තෙක් ද, එතැන් සිට එකී වසම් මායිම ඔස්සේ නැගෙනහිර දිශානුගතව අංක 100 සී පෙතංගොඩ ග්‍රාම නිලධාරි වසම් මායිම හමුවන ලක්ෂ්‍යය තෙක් ද, එතැන්සිට එකී ග්‍රාම නිලධාරි වසම් මායිම් ඔස්සේ ඊසාන හා ගිනිකොණ දිශානුගතව අංක 109 කන්නන්තොට ග්‍රාම නිලධාරි වසමෙහි උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය තෙක් ද,

*නැගෙනහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 109 කන්නන්තොට ග්‍රාම නිලධාරි වසම් මායිම් ඔස්සේ ඊසාන හා ගිනිකොණ දිශානුගතව අංක 109ඒ ගෝනාරඹ ග්‍රාම නිලධාරි වසම් මායිම් හමුවන ලක්ෂ්‍යය තෙක් ද එතැන් සිට එකී වසම් මායිම ඔස්සේ නිරිත දිශානුගතව අංක 105බී දොරනුව ග්‍රාම නිලධාරි වසම් මායිම් හමුවන ලක්ෂ්‍යය තෙක් ද එතැන් සිට එකී ග්‍රාම නිලධාරි වසමෙහි නැගෙනහිර මායිම ඔස්සේ නිරිත හා දකුණු දිශානුගතව අංක 105 වැන්දල ග්‍රාම නිලධාරි වසමෙහි උතුරු මායිම හමුන ලක්ෂ්‍යය තෙක් ද එතැන්සිට එකී ග්‍රාම නිලධාරි වසමෙහි නැගෙනහිර මායිම ඔස්සේ අඳින ලද රේඛාව තවදුරටත් කැළණි ගඟේ මධ්‍ය රේඛාව ඡේදනය කරන ලක්ෂ්‍යය තෙක් ද,

*දකුණට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට එකී ගංගාවේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර, වයඹ හා නිරිත දිශානුගතව ඇඳි රේඛාව තව දුරටත් අංක 103ඒ මොරලිය ග්‍රාම නිලධාරි වසමෙහි බටහිර මායිම ඡේදනය කරන ලක්ෂ්‍යය තෙක් ද,

*බටහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 103ඒ මොරලිය ග්‍රාම නිලධාරි වසමෙහි බටහිර මායිම ඔස්සේ උතුරු දිශානුගතව අංක 104බී මාහැල්ල ග්‍රාම නිලධාරි වසම් මායිම් හමුවන ලක්ෂ්‍යය තෙක් ද එතැන් සිට එකී වසමෙහි බටහිර මායිම ඔස්සේ වයඹ, නිරිත හා ඊසාන දිශානුගතව අංක 104සී දන්නෝරුව ග්‍රාම නිලධාරි වසම් මායිම් හමුවන ලක්ෂ්‍යය තෙක් ද එතැන් සිට එකී වසම් මායිම ඔස්සේ ඊසාන දිශානුගතව අංක 100 ඉඹුලාන ග්‍රාම නිලධාරි වසම් මායිම් හමුවන ලක්ෂ්‍යය තෙක් ද එතැන් සිට එකී ග්‍රාමනිලධාරි වසම් මායිම් ඔස්සේ වයඹ හා ගිනිකොණ දිශානුගතව ආරම්භක ලක්ෂ්‍යය තෙක් අඳින ලද රේඛාවෙන් ඇතුලත පිහිටි මුළු මහත් ප්‍රදේශය.

EOG 04 - 0240

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.